ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව - 2017
-----------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 අහිතකර මතය
------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු නොකරණ බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS/SLFRS)
----------------------------------------------

පහත සඳහන් ප්‍රමිති වලින් බැහැරවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රීලංගිප්‍ර - 01, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------------------

ප්‍රමිතියේ 32 ඡේදය ප්‍රකාරව, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මගින් අවශ්‍ය හෝ අවසර දී ඇත්නම් මිස වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතුය. කෙසේ වුවද, ණයහිමි ගිණුම්, සචලීකරණ අත්තිකාරම් මුදල් ලැබීම් ගිණුම්, උප කොන්ත්‍රාත්කරුවන්ගේ ගිණුම්, උප කොන්ත්‍රාත්කරුවන්ගේ රඳවා ගැනීම් ගිණුම් සහ උපචිත හා ප්‍රතිපාදන ගිණුම්වල හර ශේෂයන් එම ගිණුම්වල බැර ශේෂයන්ට එරෙහිව හිලව් කර තිබුණි. එබැවින් එම ගිණුම්වල බැර ශේෂයන් පිළිවෙලින් රු.25,542,855, රු.240,525,285, රු.44,696,625, රු.259,612,535 සහ රු.159,454,338 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ශ්‍රීලංගිප්‍ර - 02, තොග
--------------------

ප්‍රමිතියේ විධිවිධාන වලට අනුව, තොගය පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට අගය කළ යුතුය. එසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට නිමි භාණ්ඩ තොගවල පිරිවැය ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් සියයට 90 ත් සියයට 95 ත් අතර අගයකට අගය කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.245,149,766 ක නිමි තොග වටිනාකමෙහි නිරවද්‍යතාවය පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

(ඇ) ශ්‍රීලංගිප්‍ර - 16, දේපල, පිරියත හා උපකරණ
---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ වටිනාකම රු.91,671,319 ක් වූ ස්ථාවර වත්කම් හා මෘදුකාංග, එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමෙන් තොරව අඛණ්ඩව භාවිතා කර තිබුණි. තවද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති - 08 ප්‍රකාරව ඇස්තමේන්තුගත දෝෂය සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ii) රු.5,612,605 ක් වූ යන්ත්‍ර හා පිරියත අලුත්වැඩියා පුනරාවර්තන වියදම් ආදායම් ප්‍රකාශයට අය නොකොට ප්‍රාග්ධනීත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සහ ලාභය අධි ගණනය වී තිබුණි.

(iii) රු.3,851,120 ක් වූ මෝටර් රථ අලුත්වැඩියා ගාස්තු වටිනාකම ආදායම් ප්‍රකාශයට අය නොකොට ප්‍රාග්ධනිත කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සහ ලාභය අධි ගණනය වී තිබුණි.

(ඇ) ශ්‍රීලංගිප්‍ර - 37, වෙන්කිරීම්, අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 සිට 2016 වර්ෂ දක්වා නොගෙවූ එකතුකළ අගය මත බදු සහ 2016 වර්ෂයේ ආර්ථික සේවා ගාස්තු හා ජාතිය ගොඩනැගීමේ බදු මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පනවන ලද පිළිවෙලින් රු.121,782,475, රු.2,598,573 ක් සහ රු.162,788 ක දඩ මුදල් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

(ii) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් වැඩබිමෙහි වාහන රථගාලට සෝපානයක් සැපයීම සම්බන්ධයෙන් ඩීසල් ඉංජිනියරින් මෝටර් සමාගම (DEMO) සංස්ථාවට එරෙහිව රු.97,000,000 ක් ඉල්ලා නඩුවක් ගොනුකර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මේ සම්බන්ධයෙන් අනාවරණය කර නොතිබුණි.

(iii) තවද, උපකොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් විසින් සංස්ථාවට එරෙහිව ගොනුකර ඇති නඩු දාහතරක් මගින් ඉල්ලා තිබුණු රු.83,715,034 ක් අසම්භාව්‍ය බැරකම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රීලංගිප්‍ර - 39, මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මැනීම

---

(i) ණය සහ ලැබීම් ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමයට මැනිය යුතු වුවද, රු.168,618,915 ක් වූවසර 5 ක් ඉක්ම වූ ලැබියයුතු වෙළඳ ශේෂය ක්‍රමක්ෂය පිරිවැය ක්‍රමය යටතේ ගණනය කර නොතිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂයන් අධිගණනය වීමේ හැකියාවක් පැවතුණි.

(ii) වර්ෂ 5 ඉක්මවා පැවති රු.563,887,942 ක ලැබියයුතු රඳවා ගැනීම් ශේෂය අපහායනය සඳහා සලකා බලා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් එය මූල්‍ය ප්‍රකාශනයේ සාධාරණ වටිනාකමකින් පිළිබිඹු නොවිය.

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට වෙළඳ ණයගැතියන්, ඇණවුම් සමඟ චෙක්පත් අත්තිකාරම් සහ ලැබියයුතු රඳවා ගැනීම් ලෙජර ගිණුම්වල පිළිවෙලින් රු.71,646,891, රු.100,954,543, සහ රු.259,612,534 ක අසාමාන්‍ය බැර ශේෂයන්වූ බැවින්, එම දින වන විට එම අගයන් ඊට සමාන ප්‍රමාණයන්ගෙන් ඌණ ගණනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ලැබියයුතු රඳවා ගැනීම් ගිණුමට රඳවා ගැනීම් සඳහා එකතු කළ අගය මත බදු වැරදි ලෙස හර කිරීම නිසා ලැබියයුතු රඳවා ගැනීම් ශේෂය රු.5,323,646 කින් අධි ගණනය වී තිබුණි.

(ඇ) 2017 වර්ෂයට පෙර ආරම්භ කරන ලද ව්‍යාපෘතිවලට අදාළ ව්‍යාපෘතියේ තථ්‍ය ඇස්තමේන්තුගත පිරිවැය ගැනීම වෙනුවට ව්‍යාපෘතියේ සමස්ත පිරිවැයෙන් සියයට 89 ක් ව්‍යාපෘති ඇස්තමේන්තුගත පිරිවැය ලෙස ගණනය කර තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ නිමකිරීමේ ප්‍රතිශතය නිවැරදිව ගණනය කර නොතිබුණු අතර එම නිසා වර්ෂය සඳහා වූ ලාභය සහ සමුච්චිත ලාභය පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.3,456,829 ක් වූ ආර්ථික සේවා ගාස්තුව ගෙවා හෝ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස දක්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබුණු අතර වගකීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ගෙවියයුතු රු.5,279,315 ක් වූ ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) ප්‍රේෂණය කර හෝ මූල්‍ය ප්‍රකාශනවල වගකීමක් ලෙස දක්වා නොතිබුණු අතර එම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් දක්වා තිබුණු අතර වගකීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ජාතික යන්ත්‍රෝපකරණ සංවිධානයේ (NEMO) ව්‍යාපෘති ආදායම වැරදි ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම රු.17,136,086 කින් අධි ගණනය වී තිබුණි.

(උ) සේරුවාවිල රාජමහා විහාරයට අයත් රු. මිලියන 7.2 ක් වටිනා ඉඩම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඉඩම්වල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු. මිලියන 111.92 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි NEMO ආයතනයට අයත් නොවුනද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා රු.4,120,908 ක සමුච්චිත ක්ෂය හා රු.889,908 ක ක්ෂය ගලපා තිබුණි.

(එ) දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද රු.9,304,950 ක් පිරිවැය වූ කොන්ක්‍රීට් සිල්පර වසර 05 කට වැඩි කාලයක සිට තොගවල පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළදී ඒ මත සියයට 25 ක හෝ රු.2,326,239 ක අගය අඩුවීමක් පමණක් ගලපා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල තොග වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) තොග ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් තොග සඳහා වෙන් කිරීම් රු.2,304,544 කින් ඌණ ගණනය වී තිබූ අතර ලාභය අධි ගණනය වී තිබුණි.

(ඔ) තොග අගය කිරීමේ දෝෂයක් හේතුවෙන් රත්මලාන අංගනයේ (343) තොග වටිනාකම රු.1,114,000 කින් ඌණ ගණනය වී තිබුණි.

(ඕ) සේවා අංශයේ සහ විශේෂ මෙහෙයුම් අංශයේ වර්ෂ 3 ඉක්මවා නොපියවූ පිළිවෙලින් රු.31,354,164 ක් සහ රු.3,346,962 ක් වූ ණයගැති ශේෂයන් සඳහා අපහායනය සලසා නොතිබුණි.

(ක) ස්ථාවර වත්කම් සත්‍යාපන වාර්තාවට අනුව රු.මිලියන 4.26 ක් වටිනා වාහන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ස්ථාවර වත්කම් වටිනාකම එම ප්‍රමාණයෙන් ඌණ ගණනය වී තිබුණි.

(ග) පිරිවැය වැරදි ලෙස ගණනය කිරීම නිසා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වටිනාකම රු.1,260,672 කින් අධි ගණනය වී තිබුණි.

(ච) රු.2,417,870 ක් වටිනා විකිණිය නොහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ අපහායනය නොකර ගබඩාවල පැවතුනි.

(ජ) අසාමාන්‍ය ඍණ ශේෂයන් හිලව් කිරීමේ ප්‍රතිපලයක් ලෙස විකුණුම් පිරිවැය වටිනාකම රු.23,759,731 කින් ඌණ ගණනය වී තිබුණි.

1.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති සංස්ථාවේ සහ NEMO ආයතනයෙහි අන්තර් කණ්ඩායම් ශේෂය අතර රු.64,468,337 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ලැබියයුතු ශේෂය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගෙවියයුතු ශේෂය අතර රු.216,068,743 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2012 සිට 2015 දක්වා කාලය තුළ රු.1,328,763 ක හඳුනානොගත් තැන්පතු ශේෂයක් NEMO ආයතනයෙහි මූල්‍ය ප්‍රකාශනවල පැවතුණි.

(ඈ) සංස්ථාවේ ලැබියයුතු ශේෂය සහ නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගෙවියයුතු ශේෂය අතර රු.2,624,108 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ ණය සඳහා පොළී සහ අයිරා උපලේඛණය සහ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති ණය පොළී පිරිවැය සහ අයිරා අතර රු.6,057,203 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම්

-------------------------------------

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂිය |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ගෙවියයුතු GST | 9,594,208 | විස්තරාත්මක උපලේඛණ |
| (ආ) | ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂය | 543,921,906 | විස්තරාත්මක උපලේඛණ |
| (ඇ) | NEMO ස්ථාවර වත්කම් සමුච්චිත ක්ෂය | 118,245,087 | විස්තරාත්මක උපලේඛණ |
| (ඈ) | NEMOආදායම | 1,176,639,027 | NEMO ව්‍යාපෘතිවල ලාභ ගණන තොරතුරු |

**1.3** ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** **රු.3,176,933,801 ක් වන සමස්ත වෙළඳ ණයගැතියන්ගෙන්, සියයට 95 කට වැඩි ප්‍රතිශතයක් නියෝජනය කරන්නේ රජයේ ආයතනවලින් ලැබියයුතු මුදල් ප්‍රමාණයන් වන අතර එයින් රු.1,248,600,741 ක් හෝ සියයට 43 කට වැඩි ප්‍රතිශතයක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට අයකර නොගෙන පැවතුනි.**

**(ආ)** **සේවා අංශයේ පෙර ගෙවුම් ශේෂය රු.1,426,440 ක් වර්ෂ 05 ක් ඉක්මවා නොපියවා පැවතුනි.**

**(ඇ)** **ශුද්ධ රඳවාගැනීම් මුදල් ශේෂය වූ රු.303,315,870 ක් සහ රු.563,887,942 ක් වූ වසර 03 කට වැඩි සහ වසර 05 කට වැඩි කාලයක සිට අයකරගෙන නොමැතිව පැවතුණි.**

**(ඈ)** **සේවා අංශයේ රු.13,734,094 ක් වූ අයකර නොගෙන පවතින විදේශ මිලදීගැනීම් පාලන ගිණුමේ ශේෂය 2012 සිට පැවතුණු අතර යාන්ත්‍රික හා විදුලි අංශයේ රු.29,968,288 ක් වූ විදේශීය මිලදී ගැනීම් පාලන ගිණුමේ ආරම්භක ශේෂය වර්ෂය අවසානය දක්වාද නිරවුල් කර නොතිබුණි. එම ශේෂයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.**

**(ඉ)** **රු.540,234,948 ක් වූ ණයහිමි ශේෂයෙන් රු.14,257,406 ක් වූ ණයහිමි ශේෂයන් වසර 05 කට වැඩි කාලයක් නිරවුල් නොවී පැවතුණි.**

**(ඊ)** **ගෙවියයුතු එකතු කළ අගය මත බදු සහ භාණ්ඩ හා සේවා මත බදු ශේෂයන්ගේ එකතුව රු.887,178,455 ක් 2012 වර්ෂයේ සිට නොපියවා පැවතුනි.**

**(උ)** **උප කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති සවලීකරණ අත්තිකාරම් වටිනාකම රු.114,317,463 ක් අයකර නොගෙන වර්ෂ 05 ක් ඉක්මවා පැවතුනි.**

**(ඌ)** **සේවා සඳහා ලබා දී ඇති අත්තිකාරම් වටිනාකම රු.8,604,796 ක් අයකර නොගෙන වර්ෂ 05 ක් ඉක්මවා පැවතුනි.**

**(එ)** **තැම්පතු වටිනාකම රු.2,010,000 ක් වර්ෂ 05 ක් ඉක්මවා පැවතුනි.**

**(ඒ)** **සැපයුම්කරුවන්ගේ අත්තිකාරම් එකතුව රු.2,239,501 ක් වර්ෂ 05 ක් ඉක්මවා නොපියවා පැවතුනි.**

**(ඔ)** **සේවාදායකයින්ගෙන් ලැබුණු එකතුව රු.442,666,325 ක සවලීකරණ අත්තිකාරම් වර්ෂ 5කට වඩා වැඩි කාලයක් පැවති අතර 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම ශේෂයන් පියවීමට පියවර ගෙන නොතිබුණි.**

**(ඕ)** **රු.784,804.346 ක් වූ උපචිත වියදමින් රු.583,144,664 ක වටිනාකමක් අයකර නොගෙන වර්ෂ 5 ඉක්මවා පැවතුනි.**

**(ක)** **රු.10,562,151 ක් වූ ආදායම් බදු ශේෂය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නොගෙවා පැවතුනි.**

**(ග)** **ගනුදෙනුකරුවන්ගෙන් අයවියයුතු ශේෂය රු.197,876,933 ක් සහ ගනුදෙනුකරුවන්ට ගෙවියයුතු ශේෂය රු.32,040,246 ක් 2015 වර්ෂයේ සිට නොපියවා පැවතුනි.**

**1.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.**

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.48,735,735 ක් සහ 2016 වර්ෂයට අදාල රු.78,914,988 ක් වූ එකතු කළ අගය මත බදු ප්‍රේෂණය කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ආ) | 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | සමාලෝචිත වර්ෂයට අදාළ එකතුව රු.1,193,334 ක් සහ 2016 වර්ෂයට අදාල රු.1,196,626 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු ප්‍රේෂණය කිරීමට පියවර ගෙන නොතිබුණි. |
| (ඇ) | එවකට සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද 1979 දෙසැම්බර් 20 දිනැති අංක 121/1979 චක්‍රලේඛයේ 2(ඇ) වගන්තිය. | ඇණවුම් සමඟ චෙක්පත් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 30 ක කාලයක් තුළ පියවිය යුතුය. කෙසේ වුවත්, රු.46,641,962 ක් වූ එවැනි අත්තිකාරම් සංස්ථාවේ වර්ෂ 3 කට වැඩි කාලයක් නොවිසඳී පැවතුනි. තවදුරටත් NEMO හි රු.8,107,864 ක් වූ ඇණවුම් සමඟ චෙක්පත් අත්තිකාරම් 2015 සිට සමාලෝචිත වර්ෂය දක්වා නොවිසඳී පැවතුනි. |
| (ඈ) | එවකට සංස්ථාවේ සභාපති විසින් නිකුත් කරන ලද 1979 දෙසැම්බර් 20 දිනැති අංක 122/1979 චක්‍රලේඛයේ 4 වන වගන්තිය. | භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා මුදල් අත්තිකාරම් ලබා දුන් පසු, එවැනි අත්තිකාරම් දින 14 ක් තුළ පියවිය යුතුය. කෙසේ වෙතත්, සංස්ථාවේ සහ ජාතික යන්ත්‍රෝපකරණ සංවිධානයේ වර්ෂ 3 ඉක්මවූ විශේෂ මුදල් අත්තිකාරම් ශේෂයන් පිළිවෙලින් රු.1,935,050 සහ රු.4,881,300 ක් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නොවිසඳී පැවතුනි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.612,714,083 ක බදුවලට පසු ශුද්ධ අලාභයක් වූ අතර, ඊට අනුරූපී පසුගිය වර්ෂයේ බදුවලට පෙර ශුද්ධ අලාභය වූ රු.904,479,014 සමඟ සැසඳීමේදී, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.291,764,931 ක ශුද්ධ අලාභය අඩු වීමක් පෙන්නුම් කෙරිණි. ආදායම රු.942,964,376 කින් සහ වත්මන් බදුවල විලම්භිත බදු බලපෑම රු.569,787,951 කින් ඉහළයාම මෙම තත්ත්වයට ප්‍රධාන වශයෙන් හේතු විය.**

**2.1.1** සංස්ථාවේ එකතු කළ අගය

-------------------------------

**2013 සිට 2017 දක්වා සංස්ථාවේ එකතු කළ අගය පිළිබඳ විස්තර පහත පරිදි වේ.**

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| බදුවලට පසු ලාභය/(අලාභය) | (612,714,083) | (904,479,014) | (744,581,777) | 74,534,988 | 122,726,033 |
| (+) සේවක ප්‍රතිලාභ | 286,312,135 | 227,564,599 | 188,769,676 | 165,177,185 | 175,236,245 |
| ගෙවූ බදු - එකතු කළ අගය මත බදු | 121,520,561 | 78,839,708 | 79,009,022 | 154,211,263 | 223,179,026 |
| - ආර්ථික සේවා ගාස්තු | - | - | - | - | - |
| - ජාතියගොඩනැගීමේ බදු | 5,276,315 | 7,479,913 | 5,255,365 | 6,870,861 | 7,904,555 |
| ක්ෂය | 263,477,721 | 252,023,956 | 253,333,230 | 250,696,182 | 131,318,279 |
| සංස්ථාවේ එකතු කළ අගය | (63,872,649) | (338,570,838) | (218,214,484) | 651,490,479 | 660,364,138 |

සංස්ථාවේ එකතු කළ අගය 2013 සහ 2014 වර්ෂයේ 2014 පිරිහී ගොස් තිබුණු අතර ඉන්පසුව එය සමාලෝචිත වර්ෂය දක්වා අසාමාන්‍ය සෘණ ප්‍රතිඵලයක් පෙන්නුම් කෙරිණි.

**2.2** විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------------

**2.2.1** ලාභදායීතාවය

-----------------

සමාලෝචිත වර්ෂයේ සහ ඊට පෙර වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විශ්ලේෂණයේදී 2013 වර්ෂයේ අතිරික්තයක් වූ බව හෙළිදරව් වූ නමුත් 2013 සිට සමාලෝචිත වර්ෂය දක්වා එය ක්‍රමයෙන් පිරිහී තිබුණි. එනිසා 2013 වර්ෂයේ රු.122,726,033 ක් වූ අතිරික්තය සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.612,714,083 ක හිඟයක් බවට පත්ව තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| ආදායම | 3,623,607,372 | 2,680,642,996 | 3,168,016,408 | 7,403,418,660 | 7,965,731,512 |
| දළ ලාභය | 839,853,709 | (747,945,689) | (799,394,028) | 195,346,353 | 522,549,676 |
| (-) පරිපාලන වියදම් | (454,152,555) | (423,964,951) | (273,654,573) | (388,165,985) | (424,107,378) |
| මෙහෙයුම් ලාභය/අලාභය | (1,294,006,264) | (1,171,910,640) | (1,073,048,601) | (192,819,632) | 98,442,298 |
| (+) වෙනත් ආදායම් | 174,921,742 | 244,566,731 | 426,437,075 | 299,423,834 | 121,717,774 |
| (-) ශුද්ධ මූල්‍ය ආදායම/(වියදම) | (197,457,199) | (112,768,542) | (62,224,359) | (59,998,458) | (71,587,241) |
| බදුවලට පෙර ලාභය/අලාභය | (1,316,541,721) | (1,040,112,451) | (708,835,885) | 46,605,744 | 148,572,831 |
| (-) බදු | 703,827,698 | 135,633,437 | (35,745,892) | 27,929,244 | (25,846,798) |
| බදුවලට පසු ලාභය/අලාභය | (612,714,083) | (904,479,014) | (744,581,777) | 74,534,988 | 122,726,033 |

2.2.2 ගිණුම්කරණ අනුපාත

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු මත පදනම්ව සමාලෝචිත වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත පරිදි වේ.

| ගිණුම්කරණ අනුපාතය | 2016 | 2017 |
|---|---|---|
| | සියයට | සියයට |
| දළ ලාභ අනුපාතය | (28) | (23) |
| ශුද්ධ ලාභ අනුපාතය | (33.7) | (17) |
| පිරිවැටුම මත පරිපාලන වියදම | 15.81 | 12.5 |
| පිරිවැටුම මත ශුද්ධ මූල්‍ය වියදම | 4.20 | 5.4 |
| ජංගම අනුපාතය | 0.94 | 0.81 |
| ක්ෂණික අනුපාතය | 0.88 | 0.76 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

(අ) සමාලෝචිත වරෂය තුළ ක්‍රියාත්මක නොවූ රත්මලාන සීජීආර් වැඩපල ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙන් රු.483,138 ක අලාභයක් හඳුනාගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වරෂය තුළ NEMO ආයතනය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති හතරකින් රු.14,989,641 ක මුළු අලාභයක් සිදු වී ඇති බව නිරීක්ෂණය විය.

3.2 විවාදාත්මක ස්වභාවයේ කරුණු

(අ) රු.784,804,346 ක මුළු උපචිත ශේෂයෙන්, 8303 ගිණුම් කේතය යටතේ දක්වා ඇති රු.42,324,415 ක හර ශේෂයන් සහ රු.578,351,607 ක බැර ශේෂයන් විකුණුම්කරු හඳුනා නොගෙන පැවතුනි.

(ආ) රු.4,779,030 ක් වූ ණයගැති ශේෂයන් 2016 වර්ෂයේදී අපහායනයන් ලෙස සලකා තිබූ නමුත්, සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ එම ණයගැතියන් අපහායනය සඳහා සලකා නොමැති අතර ඊට හේතු සපයා නොමැත.

(ඇ) එකතුව රු.1,176,639,027 ක් වූ ව්‍යාපෘති 62 ක් 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා NEMO ආයතනයෙහි ලාභ ගණනය කිරීම් වලින් ඉවත් කර තිබුණි. විගණනයට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

(අ) 2017 දෙසැම්බර් 31 දිනවන විට සංස්ථාව විසින් අනුමත පහසුකම ඉක්මවා රු.49,013,876 ක බැංකු අයිරා ලබාගෙන තිබුණි.

(ආ) බැංකු අයිරා පහසුකම පෙර වර්ෂයට සාපේක්ෂව සැසදීමේ දී 2017 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 82.9 ක් හෙවත් සියයට 12 කින් වැඩි කර තිබුණි.